# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## පළමු වාර පරීක්ෂණය - 2020
## බුද්ධාගම

නම / අංකය : ...................................................... 5 ශ්‍රේණිය කාලය – 1 ¼ යි

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) බුද්ධත්වයෙන් පසු බුදුරජාණන් වහන්සේ තෙවන සතිය ගත කරන ලද්දේ,
   i රුවන් ගෙයි වැඩ සිටිමින් ii රුවන් සක්මනෙහි යෙදෙමින්
   iii අනිමිස ලෝචන පූජාවෙහි යෙදෙමින් iv යමාමහ පෙළහර පාමින්
2) විලඳ හා මී පැණි මිශ්‍ර දානය පිළිගැන්වූයේ,
   i තපස්සු හා භල්ලුක ii සුජාතා සිටුදූව
   iii චුන්ද කර්මාර පුත්‍රයා iv උපක ආජීවක
3) පස්වග තවුසන්ගෙන් කෙනෙකු නොවන්නේ,
   i වප්ප ii ආනන්ද
   iii මහානාම iv භද්දිය
4) ඡත්ත මාණවක ගාථා වලින් කියවෙන්නේ,
   i බුදු රුවනේ ගුණ ii දම් රුවනේ ගුණ
   iii සඟ රුවනේ ගුණ iv තුනුරුවනේ ගුණ
5) පන්සලට ගිය විට පළමුව වන්දනා කළ යුත්තේ,
   i බෝධීන් වහන්සේ ii බුදු පිළිම වහන්සේ
   iii වෙහෙර වහන්සේ iv දෙවියන් වහන්සේ
6) බුදුන් හා දහම් සරණ ගිය පළමු උපාසකවරු වූයේ,
   i වප්ප හා භද්දිය ය. ii සැරියුත් හා මුගලන් ය.
   iii තපස්සු හා භල්ලුක ය. iv ආලාරකාලාම හා උද්දකරාම පුත්ත ය.
7) පස්වග භික්ෂූන් වහන්සේලා රහත්භාවයට පත් වූයේ කුමන සූත්‍රය ඇසීමෙන්ද?
   i දම්සක් පැවතුම් සූත්‍රය. ii අනන්ත ලක්ඛන සූත්‍රය.
   iii රතන සූත්‍රය. iv කරණීය මෙත්ත සූත්‍රය.
8) බෝධි පූජාව සඳහා අවශ්‍ය නොවන ද්‍රව්‍යයකි.
   i කොඩි වැල් ii ගිලන්පස
   iii මල්, තෙල්, හඳුන්කූරු iv පඬුරු
9) සිදුහත් කුමරුගේ භාර්යාව වූයේ,
   i කිසාගෝතමියයි. ii මහාමායා දේවියයි.
   iii යශෝධරා දේවියයි. iv ප්‍රජාපති දේවියයි.

10) මිහිඳු හිමි ලංකාවට වැඩම කළේ,

i වෙසක් පෝය දා. ii පොසොන් පෝය දා

iii ඇසළ පෝය දා iv නිකිනි පෝය දා

(ලකුණු 10 x 2 = 20)

- නිවැරදි පිළිතුර තෝරා තිත් ඉර මත ලියන්න.

1) මාර දූවරු තිදෙනාගෙන් අයෙකි .........................................(තණ්හා / රදී)

2) මුචලින්ද නාග රාජයා බුදු සිරුර වටා දරණ ගසා සිටියේ, ......................................... (සිව්වන සතියේ / සයවන සතියේ) දී ය.

3) බුදු සසුනේ පළමුව ම සෝවාන් මාර්ග ඵලයට පත්වූයේ, ..........................................................( මහානාම / කොණ්ඩඤ්ඤ) තාපසතුමා ය.

4) පළමුව සිනාසීම ..................................................(පුබ්බභාසී / පුබ්බහාසී) නමින් හැඳින්වෙයි.

5) ඡත්ත මාණවක මියගොස් ඉපදුණේ ........................................................ (අපායේ / දෙව්ලොව) ය.

6) "දළදා සමිඳුගේ පිහිටයි !" යන්න.......................................................... (ආශිර්වාදයකි. / ශාසනික වචනයකි.)

7) පාරේ ගමන් කරන විට .......................................................... (දකුණු පසින් / වම් පසින්) සංවරව ගමන් කළ යුතුය.

8) සිදුහත් කුමරු උපන්නේ .......................................................... (උපවත්තන සල් උයනේ / ලුම්බිණි සල් උයනේ) ය.

9) බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවේ උපතින්............................................ (අසූ වැනි / අනූ වැනි) වියේ දී ය.

10) පස්වග තවුසන් වාසය කළේ .......................................................... (ඉසිපතනයේ / කිඹුල්වත් නුවර) ය.

(ලකුණු 10 x 2 = 20)

- පහත වාක්‍ය කියවා හරි නම් ( ✓ ) ලකුණ ද, වැරදිනම් ( × ) ලකුණද වරහන් තුළ යොදන්න.

1) නින්දට පෙර දත් මැද මුහුණ සේදිය යුතුය. (.........)

2) මෙත්තා, කරුණා, මුදිතා හා උපේක්ඛා යනු චතුරාර්ය සත්‍ය ලෙස හැඳින්වේ. (.........)

3) ඉවත දමන දෑ තැන තැන දැමිය යුතුය. (.........)

4) බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ විගස මහ පොළොව කම්පා විය. (.........)

5) බුදුරජාණන් වහන්සේ පස්වග තවුසන්ට ඒහි භික්ඛු භාවයෙන් පැවිද්ද හා උපසම්පදාව ලබා දුන් සේක. (.........)

6) ගම්පති මහා බ්‍රහ්මයා බුදු රජාණන් වහන්සේගෙන් ශ්‍රී සද්ධර්මය ලෝකයාට දේශනා කරන මෙන් ඉල්ලීමක් කළේය. (.........)

7) අනිමිස ලෝචන පූජාවෙහි යෙදීමෙන් බුදුරදුන් කළ ගුණ සැලකීමේ ගුණය ලෝකයාට පෙන්වා දුන් සේක. (.........)

8) මඟතොට යන එන විට ආරක්ෂාව පතා ඡත්ත මාණවක ගාථා සිහිකිරීම වැදගත්ය. (.........)

9) සතුට උතුම් ම ලාභයයි. (.........)

10) පිරිත් නූල් ගැට ගසන්නේ වම් අතේය. (.........)

(ලකුණු 10 x 2 = 20)

- ගැළපෙන සේ යා කරන්න.

| | |
|---|---|
| 1) තුනුරුවන් | • 16 කි. |
| 2) සොළොස්මස්ථාන යනු ස්ථාන | • බුද්ධ, ධම්ම, සංඝ |
| 3) දිනපතා කළ යුතු හොඳ පුරුද්දකි. | • උදෑසන අවදි වීම. |
| 4) යමාමහ පෙළහර පෑම. | • පළමු සතිය. |
| 5) ඉසිපතනය බලා වඩින අතර මග හමු වූයේ. | • උපක ආජීවක |
| 6) මාර දූවරු පරාජය කිරීම. | • 45 කි. |
| 7) ඵලදායී විවේකයක් සඳහා | • පස්වන සතිය |
| 8) පන්සාළිස් වසක් යනු වසර | • පොත් කියවීම. |
| 9) සූකර මද්දව දානය | • පිරිකර |
| 10) තෑගි | • චුන්ද කර්මාර පුත්‍රයා |

(ලකුණු 10 x 2 = 20)

- කවියේ හිස්තැන් පුරවන්න.

රන්වන් පාටින් දළුලන බෝධිය

..............................................................

ගෞතම මුනිඳුන් පිටදුන් බෝධිය

..............................................................

(ලකුණු 2 x 2 = 4)

• පිළිතුරු ලියන්න.

1) සිදුහත් බෝසත්තුමාණෝ සම්මා සම්බුද්ධත්වයට පත්වූයේ කුමන පොහොය දිනක දී ද?

........................................................................................................

2) බුදුරඳුන්ගේ පළමු ධර්ම දේශනාව කුමක් ද?

........................................................................................................

3) බුදුරජාණන් වහන්සේගේ අන්තිම ශ්‍රාවකයා කවුරුන්ද?

........................................................................................................

4) උපන්දිනයට කළ හැකි පිංකම් දෙකක් ලියන්න.

1 ............................................................

2 ............................................................

5) දිනපතා අනුගමනය කළ යුතු හොඳ පුරුදු දෙකක් ලියන්න.

1 ............................................................

2 ............................................................

6) බුදුරජාණන් වහන්සේ පිරිනිවීමට පෙර රහත් බව ලබා ගැනීමට උත්සාහ කළ හිමි නම කවුරුන්ද?

........................................................................................................

7) යස සිටු පුත්‍රයාගේ යහළුවන් දෙදෙනෙකු නම් කරන්න.

1 ............................................................

2 ............................................................

8) සම්බුද්ධ පරිනිර්වාණය සිදු වූ මොහොතේ ඇති වූ අසිරිමත් සිදුවීම් දෙකක් ලියන්න.

1 ............................................................

2 ............................................................ (ලකුණු 8 x 2 = 16)